(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 14(6).]

# පාර්ලිමේන්තුවේ අංක 14 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2015 ජූනි මස 22 වැනි සඳුදා**

## 2015 ජූලි මස 07 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4812/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාධ්‍යවේදීන්ට නොමිලේ ලැප්ටොප් පරිගණක ලබාදීමේදී විනිවිදභාවයෙන් කටයුතු නොකළ බවටත්;

(ii) කොන්ත්‍රාත් පදනම මත කටයුතු කරන සහ විශ්‍රාම ගොස් සිටින මාධ්‍යවේදීන් පිරිසකට ද ලැප්ටොප් පරිගණක ලබා දුන් බවටත්;

මාධ්‍යවේදීන් චෝදනා කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ලැප්ටොප් පරිගණක ලබා දුන් එක් එක් මාධ්‍යවේදියාගේ සේවා කාලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කොන්ත්‍රාත් පදනම මත කටයුතු කරන හා විශ්‍රාමික මාධ්‍යවේදීන්ට ද එම පරිගණක ලබා දී තිබේ නම්, එවැනි මාධ්‍යවේදීන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එසේ ලැප්ටොප් පරිගණක ලබාදීමට වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) ලැප්ටොප් පරිගණක ලබා දී ඇති ස්ථිර මාධ්‍යවේදීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5131/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2014 දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව ක්‍රියාත්මක කළ කුඩා වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ කුරුණෑගල මැතිවරණ කොට්ඨාසයේ, වැල්ලව, තල්විට වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට අදාළ නාම පුවරුව එම වැව අසල ස්ථාපිත කර ඇතත්, මෙතෙක් එහි ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ නොකිරීමට හේතු කවරේද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iv) එම වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5940/'15

ගරු අනුර දිසානායක මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2000 සිට 2010 දක්වා කාල සීමාව තුළදී ශ්‍රී ලංකා නාවික හමුදාවේ විධායක ශාඛාවට බඳවා ගැනීම සඳහා සලකා බැලූ අධ්‍යාපන සුදුසුකම් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2006 වර්ෂයේදී ශ්‍රී ලංකා නාවික හමුදාවේ විධායක ශාඛාව සඳහා බඳවා ගත් සංඛ්‍යාව කොපමණද;

(iii) එම වර්ෂයේදී බඳවා ගත් කණ්ඩායමට අයත් වූ යෝෂිත රාජපක්ෂ මහතාගේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) සුදුසුකම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) යෝෂිත රාජපක්ෂ මහතා ශ්‍රී ලංකා නාවික හමුදාවට බැඳුනු දිනය කවරේද;

(ii) ඔහු පුහුණුව සඳහා බ්‍රිතාන්‍යයේ රාජකීය නාවික ඇකඩමියට බැඳුනු දිනය කවරේද;

(iii) එම පාඨමාලාව සඳහා යෝෂිත රාජපක්ෂ මහතා තෝරා ගැනීමට අදාළ කරගත් නිර්ණායක කවරේද;

(iv) ඔහු එම පුහුණුව අවසන් කළ දිනය කවරේද;

(v) එම පුහුණුව අවසානයේ පැවති විභාගවලින් ඔහු ලද ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5946/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගේ හා නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩල පත් කිරීම් ජනාධිපති ලේකම්ගේ අංක CA/1/171/1 හා 2010 මැයි 14 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයට අනුව සිදුකර තිබේද;

(ii) ඉහත සඳහන් කාර්ය මණ්ඩලයන්ට පත්කර ඇති අයගේ නම්, තනතුරු, ලිපිනයන්, දුරකථන අංක, සුදුසුකම් ආදී විස්තර සභාගත කරන්නේද;

(iii) එම කාර්ය මණ්ඩලවල නිල වාහන හිමිකම් සහිත නිලධාරීන්ට ලබා දී ඇති වාහනවල වර්ග, අංක හා ඒවායේ නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

(iv) ඉහත අමාත්‍යවරයාට හා නියෝජ්‍ය අමාත්‍යවරයාට ලබා දී ඇති වාහන කවරේද;

(v) එම වාහනවලට අමතරව අමාත්‍යාංශ සංචිතයෙන් හෝ විෂයානුබද්ධ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවලින් මෙන්ම විවිධ ව්‍යාපෘති වලින් අමාත්‍යවරයාට, නියෝජ්‍ය අමාත්‍යවරයාට හෝ එම කාර්ය මණ්ඩලවලට ලබාගෙන ඇති වාහන කවරේද;

(vi) එම වාහනවල අංක, වර්ග හා නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6017/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2014.12.24 දින කඹුරුපිටිය, නාරංදෙනිය ජාතික පාසල් ක්‍රීඩාංගණයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මැතිවරණ ප්‍රචාරක රැස්වීමක් පවත්වනු ලැබුවේද;

(ii) ඒ සඳහා විදුහල්පතිවරයාගේ හෝ ජාතික පාසල් අධ්‍යක්ෂවරයාගේ අවසරය ලබාගෙන තිබේද;

(iii) ඉහත සඳහන් දිනයේ පැවති ජනාධිපති අපේක්ෂක ප්‍රචාරක රැස්වීම වෙනුවෙන් 2014.12.16 දින ඉහත සඳහන් පාසලේ තාප්පය කඩා ඉවත් කළේද;

(iv) පාසල් කමිටුවේ ඉල්ලීමක් මත විදුහල්පතිවරයා විසින් එම තාප්පය කඩා ඉවත් නොකරන ලෙස පොලිසියට පැමිණිලි කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තාප්පය කඩා ඉවත් කිරීම නිසා ක්‍රීඩා පිටියට සහ පාසලේ දරුවන්ගේ ආරක්ෂාවට හානිකර තත්ත්වයක් ඇති වී තිබේද;

(ii) දේශපාලනමය අවශ්‍යතාවයක් මත කඩා ඉවත්කරන ලද තාප්පයට දරන ලද වියදම කොපමණද;

(iii) එම තාප්පය පාසල් දරුවන්ගේ මව්පිය මූල්‍ය ආධාර යටතේ ඉදිකරනු ලැබුවක්ද;

(iv) කඩා දමන ලද තාප්පය යථා තත්ත්වයට පත් කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6023/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලාංකිකයන් විසින් ලෝකයේ විවිධ රටවල්වල පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගිණුම්වල ශේෂයන් එක් එක් රට අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එකී ගිණුම් හිමියන් ශ්‍රී ලංකාවේ නීති උල්ලංඝනය කරමින් එම ගිණුම්වල මුදල් තැන්පත් කර තිබේද;

(iv) එසේ නම්, එවැනි ගිණුම් පිළිබඳව තොරතුරු කවරේද;

(v) ඉහත කී සියලු ගිණුම්වල තොරතුරු ලබා ගැනීම සඳහා රාජ්‍ය තාන්ත්‍රික මට්ටමෙන් අදාළ බැංකුවලින් ඉල්ලීම් කර තිබේද;

(vi) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(vii) එකී ගිණුම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට කටයුතු කරන්නේද;

(viii) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මවිසින් මීට ඉහත අවස්ථාවකදී ස්විට්සර්ලන්තයේ HSBC බැංකුවේ ඇති ගිණුම් පිළිබඳව පාර්ලිමේන්තුවේදී කළ විමසුමට ලබා දුන් පිළිතුරෙහි මූල්‍ය බුද්ධි අංශයට අදාළ නීති අවශ්‍ය පරිදි සංශෝධනය කරගත යුතු බවට සඳහනක් වූයේද;

(ii) එසේ නම්, ඒ අනුව එකී නීති මේ වන විට සංශෝධනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6033/'15

ගරු විජිත හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට සේවයේ යොදවා ගත හැක්කේ එක් ලේකම්වරයෙකු පමණක් බවත්;

(ii) එම ලේකම් තනතුරේ වර්ෂ 12ක් සේවය කළ කේ. කේ. ජී. පද්මා මහත්මිය 2010.08.12 දින සිට එකී තනතුරෙන් මාරුකර යවා ඇති බවත්;

(iii) එකී මාරු කිරීමට හේතුව හිටපු අධ්‍යක්ෂ ජනරාල් අනුෂ පැල්පිට මහතා විසින් අනුමත සීමාව ඉක්මවා භාවිතා කළ වාහනවල ධාවන සටහන් අත්සන් කිරීම ඇය විසින් ප්‍රතික්ෂේප කිරීම බවත්;

(iv) ඇය එම තනතුරේ කාර්යය නියමයක් නොමැති තත්ත්වයට පත්කර, වෙනත් අයෙකු වැඩබලන ලේකම්වරියක් වශයෙන් පත්කර මාසික දීමනාවක් ගෙවන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අදාළ තනතුරට පත් කළ පුද්ගලයෙකු සිටියදී දීමනා ගෙවා තවත් අයෙකු සේවයේ යොදා ගැනීම සම්පූර්ණ නීති විරෝධී ක්‍රියාවක් නොවන්නේද;

(ii) කේ. කේ. ජී. පද්මා මහත්මිය නැවත අදාළ තනතුරෙහි සේවයේ යොදවා ඇයට අහිමි කළ උසස්වීම් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6037/ 15

ගරු රාජීව විජේසිංහ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) එල්.ටී.ටී.ඊ. සංවිධානයට සම්බන්ධකම් ඇති පිරිසකට කොන්ත්‍රාත්තුවක් ලබා දුන්නේයැයි එක්සත් ජාතීන්ගේ හිටපු නිත්‍ය නියෝජිත වන ක්ෂේනුකා සෙනෙවිරත්න මහත්මියට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා පිළිබඳව; සහ

(ii) එක්සත් රාජධානියේ හිටපු මහ කොමසාරිස් ආචාර්ය ක්‍රිස් නෝනිස් මහතාට පහරදීමේ සිද්ධියෙන් පසුව සෙනෙවිරත්න මහත්මිය විසින් ඔහුට විරුද්ධව ඉදිරිපත් කර තිබූ චෝදනා පිළිබඳවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් චෝදනා එක්සත් ජාතීන්ගේ හිටපු නිත්‍ය නියෝජිතවරුන්ගෙන් කෙනෙකු වන තමරා කුනනායගම් මහත්මිය විසින් සෙනෙවිරත්න මහත්මිය සමඟ තිබූ පෞද්ගලික ආරවුලක් නිසා සිදු කළ බව මෑතකදී පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකදී ඔහු ප්‍රකාශ කළ බවත්;

(ii) එසේ ප්‍රකාශ කිරීමට ඔහු සතුව සාක්ෂි තිබේද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම චෝදනා සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් සිදුකර තිබේද;

(ii) එම චෝදනා පිළිබඳව වන විමර්ශන වාර්තා සභාගත කරන්නේද;

(iii) ඉහත (අ) (i) හි සඳහන් කොන්ත්‍රාත්තුව පිළිබඳව මහා භාණ්ඩාගාරයේ නියෝජිතයන් විසින් සකස් කරන ලද විගණන වාර්තාව කියවා තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6038/'15

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හලාවත සහ පුත්තලම ශ්‍රී ලංගම ඩිපෝවල සේවය කළ ඩිපෝ කළමනාකරුවන් සහ සහකාර කළමනාකරුවන් කිසිදු චෝදනාවක් නොමැතිව එම තනතුරුවලින් ඉවත් කර ඇති බවත්;

(ii) එම තනතුරු සඳහා අවම වශයෙන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට හෝ පෙනී නොසිටි, වෙනත් කිසිදු සුදුසුකමක් ද නොමැති අය පත්කර ඇති බවත්;

(iii) එසේ නුසුදුසු පුද්ගලයින් පත් කිරීම නිසා එම ආයතන පිරිහෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත අ (i)හි සඳහන් තනතුරුවලින් ඉවත් කළ අය නැවත පත්කර, යහපාලනයට ආදර්ශයක් ලබාදීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6062/'15

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2014 වර්ෂයේ දී රේඛීය අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ උතුරු පළාත් අධ්‍යාපන, සංස්කෘතික, ක්‍රීඩා සහ තරුණ කටයුතු අමාත්‍යාංශය විසින් පවත්වනු ලැබූ අධ්‍යාපන සම්මන්ත්‍රණය පිළිබඳව; සහ

(ii) එම සම්මන්ත්‍රණයේ අරමුණු, සම්මන්ත්‍රණයට වෙන්කළ මුදල්, සම්මන්ත්‍රණයේදී ගනු ලැබූ තීරණ පිළිබඳව;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත අ(ii) හි සඳහන් කරුණුවලට අදාළව ගනු ලැබූ විවිධ ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6074/'15

ගරු ටී. බී. ඒකනායක මහතා,— මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) දැයට කිරුළ වැඩසටහනට සමගාමීව මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක වෙමින් පැවති ව්‍යාපෘතීන් මේ වන විට නවතා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(ii) එකී ව්‍යාපෘති නවතා දැමීම හේතුවෙන් රැකියා අහිමි වූ පිරිස කොපමණද;

(iii) ඔවුන්ගේ රැකියා අහිමිවීමේ ගැටලුවට ලබා දෙන විසඳුම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6108/'15

ගරු ඊ. සරවනපවන් මහතා,— නැවත පදිංචි කිරීම, ප්‍රතිසංස්කරණය හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2009 හා ඊට පෙර කාලය තුළදී යුද්ධයෙන් පීඩාවට පත් රාජ්‍ය සේවකයන්ට දේපළ වන්දි හා වෙනත් සහන ලබා දීමට අනුමතිය ලද නමුත් මෙතෙක් අදාළ වන්දි හෝ සහන නොලැබූ රාජ්‍ය සේවකයන් සිටින්නේද;

(ii) එසේ සහන ලබා දිය යුතු උතුරු පළාතේ රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන්ට ලබා දිය යුතු මුළු වන්දි මුදල කොපමණද;

(iv) නිසි කාල සීමාව තුළදී එම වන්දි මුදල ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4980/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දකුණු පළාත් සභාවට අයත් පාසල්වල පවතින උපාධිධාරී ගුරු පුරප්පාඩු පිරවීමට 2012.08.28 දින ගැසට් නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවූ බවත්;

(ii) 2012 නොවැම්බර් මාසයේ ඊට අදාළ ලිඛිත පරීක්ෂණ පැවැත්වූ බවත්;

(iii) එම වර්ෂයේම දෙසැම්බර් මාසයේදී සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත වර්ෂය වන විට දකුණු පළාතේ පැවති උපාධිධාරී ගුරු පුරප්පාඩු සංඛ්‍යාව;

(ii) එවකට පැවති දෙමළ මාධ්‍ය උපාධිධාරී ගුරු පුරප්පාඩු සංඛ්‍යාව;

(iii) එක් එක් විෂය අනුව දෙමළ මාධ්‍යයෙන් පැවති ගුරු පුරප්පාඩු සංඛ්‍යාව;

(iv) එම අවස්ථාවේ පැවති සිංහල මාධ්‍ය උපාධිධාරී ගුරු පුරප්පාඩු සංඛ්‍යාව;

(v) එක් එක් විෂය අනුව සිංහල මාධ්‍යයෙන් පැවති ගුරු පුරප්පාඩු සංඛ්‍යාව;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් පුරප්පාඩු පිරවීමට පැවැත්වූ ලිඛිත පරීක්ෂණයට පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අයදුම්කරුවන්ගේ නම්, ලිපිනයන් සහ ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමාණයන් කවරේද;

(iii) බඳවා ගැනීමේ කඩඉම් ලකුණු ප්‍රමාණය කවරේද;

(iv) ගුරුවරුන් ලෙස බඳවා ගත් අයදුම්කරුවන්ගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5248/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුරුණෑගල ඩී. බී. වෙලගෙදර මධ්‍ය මහා විද්‍යාලයේ මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාරයක් ඉදි කර තිබේද;

(ii) එම විද්‍යාගාරයට අවශ්‍ය යටිතල පහසුකම් සපයා තිබේද;

(iii) එම විද්‍යාගාරය විවෘත කරන දිනය කවරේද;

(iv) එම විද්‍යාලය ද්විතීයික පාසලක් බවට පත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5947/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ස්වදේශ කටයුතු අමාත්‍යවරයාගේ සහ එම නියෝජ්‍ය අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩල පත් කිරීම් ජනාධිපති ලේකම්ගේ අංක CA/1/171/1 හා 2010 මැයි 14 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය අනුව සිදුකර තිබේද;

(ii) ඉහත සඳහන් කාර්ය මණ්ඩලයන්ට පත්කර ඇති අයගේ නම්, තනතුරු, ලිපිනයන්, දුරකථන අංක, සුදුසුකම් ආදී විස්තර සභාගත කරන්නේද;

(iii) එම කාර්ය මණ්ඩලවල නිල වාහන හිමිකම් සහිත නිලධාරීන්ට ලබා දී ඇති වාහනවල වර්ග, අංක හා ඒවායේ නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

(iv) ඉහත අමාත්‍යවරයාට සහ නියෝජ්‍ය අමාත්‍යවරයාට ලබා දී ඇති වාහන කවරේද;

(v) එම වාහනවලට අමතරව, අමාත්‍යාංශ සංචිතයෙන් හෝ විෂයානුබද්ධ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවලින් මෙන්ම විවිධ ව්‍යාපෘති වලින් අමාත්‍යවරයාට, නියෝජ්‍ය අමාත්‍යවරයාට හෝ එම කාර්ය මණ්ඩලවලට ලබා ගෙන ඇති වාහන කවරේද;

(vi) එම වාහනවල අංක, වර්ග හා නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 ජූලි මස 08 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4981/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මීනුවන්ගොඩ ආයෝජන ප්‍රවර්ධන කලාපයේ පිහිටි සීමාසහිත වෙහිකල්ස් ලංකා පුද්ගලික සමාගම ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි කර තිබේද;

(ii) එසේ නම්, එම සමාගම ලියාපදිංචි කළ දිනය කවරේද;

(iii) එම සමාගමේ හිමිකරු / හිමිකරුවෝ කවුරුන්ද;

(iv) එම සමාගම ලියාපදිංචි කිරීමේදී එම ව්‍යාපාරයේ ස්වභාවය දක්වා ඇති ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5948/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලය පත්කිරීම ජනාධිපති ලේකම්ගේ අංක CA/1/171/1 හා 2010 මැයි 14 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය අනුව සිදුකර තිබේද;

(ii) ඉහත සඳහන් කාර්ය මණ්ඩලයන්ට පත්කර ඇති අයගේ නම්, තනතුරු, ලිපිනයන්, දුරකථන අංක, සුදුසුකම් ආදී විස්තර සභාගත කරන්නේද;

(iii) එම කාර්ය මණ්ඩලවල නිල වාහන හිමිකම් සහිත නිලධාරීන්ට ලබා දී ඇති වාහනවල වර්ග, අංක හා ඒවායේ නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

(iv) ඉහත අමාත්‍යවරයාට ලබා දී ඇති වාහන කවරේද;

(v) එම වාහනවලට අමතරව, අමාත්‍යාංශ සංචිතයෙන් හෝ විෂයානුබද්ධ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවලින් මෙන්ම විවිධ ව්‍යාපෘති වලින් අමාත්‍යවරයාට හෝ එම කාර්ය මණ්ඩලවලට ලබා ගෙන ඇති වාහන කවරේද;

(vi) එම වාහනවල අංක, වර්ග හා නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6047/'15

ගරු රාජීව විජේසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2006 වසරට පෙර කාල සීමාව තුළ සිදුවූ ප්‍රචණ්ඩ ක්‍රියාමාලාව පිළිබඳ සොයා බැලීම සඳහා දිවංගත ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙකු වූ උදලාගම මහතා යටතේ කොමිසමක් පත් කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම කොමිසමේ වාර්තාව පිළිගන්වන ලද්දේ කවදාද;

(ii) එම වාර්තාව ප්‍රසිද්ධියට පත් නොකිරීමට හේතුව කවරේද;

(iii) එම වාර්තාවේ අන්තර්ගතයන් ප්‍රකාශයට පත් කිරීමට පියවර ගන්නේද;

(iv) එම වාර්තාවේ සඳහන් සොයාගැනීම්වලට අනුව අවශ්‍ය නම් අධිකරණමය පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6063/'15

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) චුන්නක්කම් හි ක්‍රියාත්මක වන "Northern Power Station" ආයතනය හා ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය ඇතිකරගත් ගිවිසුමක් පිළිබඳව දන්නේද;

(ii) එසේ නම්, එකී ගිවිසුමට අනුව එම ආයතනය විසින් ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයට මාසිකව ලබා දිය යුතු විදුලි ඒකක ගණන කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විට " Northern Power Station" ආයතනය ක්‍රියාත්මක නොවන බව දන්නේද;

(ii) එම ආයතනය අක්‍රීයවීම හේතුවෙන් උද්ගත වී ඇති ප්‍රායෝගික ගැටලුවලට විසඳුම් හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6109/'15

ගරු ඊ. සරවනපවන් මහතා,— නැවත පදිංචි කිරීම, ප්‍රතිසංස්කරණය හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2009 වසරේදී සුබසාධන මධ්‍යස්ථානවල සිට නැවත පදිංචි කළ ජනතාවට විවිධ ආයතන ඔස්සේ ලබා දුන් දීමනා යටතේ පළමුවැනි අදියර ලෙස රු.25000/= දීමනාවක් ද, දෙවැනි අදියර ලෙස තවත් රු.25000/= දීමනාවක් ද ලබා දීම සඳහා යෝජනාවක් වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) නැවත පදිංචි වූ පවුල් අතරින් ඉහත සඳහන් සම්පූර්ණ දීමනාව ලබා දුන් පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) නැවත පදිංචි වූ පවුල් අතරින් එම කිසිදු දීමනාවක් නොලද පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එකී දීමනාව ලබා දීම සඳහා විස්තර ලබා ගෙන ඇතත්, දෙවැනි අදියරට අදාළ දීමනා නොලැබූ පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6113/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ දී පොලිස් පරීක්ෂකවරුන් ප්‍රධාන පොලිස් පරීක්ෂක ධුරයට උසස් කිරීම සඳහා පරීක්ෂණයක් පැවැත්වූයේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම පරීක්ෂණයේදී අදාළ උසස්වීම් සඳහා නිලධාරීන් තෝරා ගැනීමට යොදාගත් නිර්ණායකයන් කවරේද;

(iv) එම පරීක්ෂණයේදී නිලධාරියා විසින් උපයා ගත් ලකුණු සහ පොලිස්පතිවරයා විසින් ලබා දුන් ලකුණු එක් එක් නිලධාරියා අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5460/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේ දී ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) 2013 සහ 2014 වර්ෂයන්හිදී ශ්‍රී ලංකාවට වැඩිම සංචාරකයින් සංඛ්‍යාවක් පැමිණ ඇති රටවල් දහය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) සංචාරක ව්‍යාපාරය නගා සිටුවීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සංචාරක ව්‍යාපාරය පුළුල් කිරීමේදී පරිසරයට හා සංස්කෘතියට සිදුවන හානි අවම කරගැනීමට අදාළව සැලසුම් සහගත වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) එවැනි වැඩපිළිවෙළක් නොමැති නම්, සංචාරක ව්‍යාපාරය පුළුල් කිරීමට සමගාමීව පරිසරය හා සංස්කෘතිය ආරක්ෂා කිරීමට සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5949/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සහ එම නියෝජ්‍ය අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩල පත් කිරීම් ජනාධිපති ලේකම්ගේ අංක CA/1/171/1 හා 2010 මැයි 14 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය අනුව සිදුකර තිබේද;

(ii) ඉහත සඳහන් කාර්ය මණ්ඩලයන්ට පත්කර ඇති අයගේ නම්, තනතුරු, ලිපිනයන්, දුරකථන අංක, සුදුසුකම් ආදී විස්තර සභාගත කරන්නේද;

(iii) එම කාර්ය මණ්ඩලවල නිල වාහන හිමිකම් සහිත නිලධාරීන්ට ලබා දී ඇති වාහනවල වර්ග, අංක හා ඒවායේ නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

(iv) ඉහත අමාත්‍යවරයාට සහ නියෝජ්‍ය අමාත්‍යවරයාට ලබා දී ඇති වාහන කවරේද;

(v) එම වාහනවලට අමතරව, අමාත්‍යාංශ සංචිතයෙන් හෝ විෂයානුබද්ධ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවලින් මෙන්ම විවිධ ව්‍යාපෘති වලින් අමාත්‍යවරයාට, නියෝජ්‍ය අමාත්‍යවරයාට හෝ එම කාර්ය මණ්ඩලවලට ලබා ගෙන ඇති වාහන කවරේද;

(vi) එම වාහනවල අංක, වර්ග හා නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6105/'15

ගරු රාජීව විජේසිංහ මහතා,— උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට මෑතකදී පත්කරන ලද සාමාජිකයන් සියලු දෙනා කොළඹ පදනම් කොට පත්කර තිබේද;

(ii) ඔවුන් අතර සිටින වෛද්‍ය වෘත්තිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් සේවය කරන විශ්වවිද්‍යාලයන් කවරේද;

(iv) එකී කොමිෂන් සභාවට ජනාධිපති උපදේශක ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා පත්කිරීමට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා පත්කිරීම පිණිස හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරණතුංග මහත්මියගේ උපදෙස් ලබා ගත්තේද;

(ii) ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා තෘතීය අධ්‍යාපන හා පුහුණු අමාත්‍යාංශයේ උපදේශකවරයෙක්ව සිටියදී, විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙහි ගුණාත්මක භාවය හා අදාළභාවය වැඩිදියුණු කිරීමේ ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ කොන්ත්‍රාත්තුවක් ඒ මහතාගේ පුත්‍රයා සේවය කළ ආයතනයකට ලබාදී තිබේද;

(iii) එම ව්‍යාපෘතිය යටතේ පැවැත්වූ ශ්‍රම වෙළඳපළ සමීක්ෂණයක ප්‍රතිඵල මත වාර්තාවක් සකසනු ලැබුවේද;

(iv) එකී සමීක්ෂණ වාර්තාව සභාගත කරන්නේද;

(v) විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙහි ගුණාත්මක භාවය හා අදාළභාවය වැඩිදියුණු කිරීම පිණිස එකී සමීක්ෂණයෙහි ප්‍රතිඵල යොදාගනු ලැබුවේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6110/'15

ගරු ඊ. සරවනපවන් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යුද්ධය හේතුවෙන් වන්නි ප්‍රදේශයේදී අතහැර දමා ගොස් තිබූ මුළු වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) 2013 මාර්තු වන විට එම වාහන අතරින් 1724ක් අයිතිකරුවන්ට ආපසු ලබා දී තිබූ බව දන්නේද;

(iii) මේ වන විට නිශ්චිත වශයෙන් අයිතිකරුවන්ට ආපසු ලබාදී ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(iv) මෙතෙක් ආපසු භාර දී නොමැති වාහනවල වත්මන් තත්ත්වය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6114/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික පාසල් ආසන්නයේ ඔප්පු නොලද මහල් නිවාසවල සහ සහාධිපත්‍ය නිවාසවල ස්ථිරව පදිංචි වී සිටින දරුවන් අදාළ පාසලට ඇතුළත් කර නොගැනීමට හේතු කවරේද;

(ii) දරුවන් පාසලට ඇතුළත් කිරීමේදී දෙමාපියන්ගේ ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද නාමලේඛන, ජල බිල්පත් හා විදුලි බිල්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් නොවන්නේද;

(iii) ඉහත (i) හි පරිදි අසාධාරණයට ලක්වී, පාසලක් නොලද දරුවන් සම්බන්ධයෙන් මේ වන විට ගෙන ඇති පියවර කවරේද;

(iv) ඔප්පු නොලද, සහාධිපත්‍ය නිවාසවල හා මහල් නිවාසවල වෙසෙන දරුවන් 2015 වර්ෂය සඳහා ආසන්න ජාතික පාසලට ඇතුළත් කර ගැනීම සඳහා මේ වන විට යෝජනා කර ඇති ක්‍රමවේදයන් කවරේද;

(v) 2015 වර්ෂය සඳහා මේ වන විටත් පාසලක් ලැබී නොමැති දරුවන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5461/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.05.25 වැනි දින කොළඹ වරායට නුදුරු මුහුදෙහි පිහිටි බොර තෙල් ප්‍රවාහනය කරන නළය අබලන් වීම නිසා බොර තෙල් ප්‍රවාහනය කරන නෞකා සඳහා ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදු වූ නැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නෞකාවට ගෙවූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නළය අලුත්වැඩියා කිරීමට ගත වූ දින ගණන කොපමණද;

(iv) මේ හේතුවෙන් සපුගස්කන්ද තෙල් පිරිපහදුව සම්පූර්ණයෙන් වසා තැබීමට සිදු වූ දින ගණන කොපමණද;

(v) ඉන්ධන ප්‍රවාහන නළයට සිදු වූ මෙම හානිය හේතුවෙන් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදු වූ සමස්ත අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බෝයාවට අවශ්‍ය නළ මිලදී ගැනීමට අවසන් වරට ටෙන්ඩර් කැඳවීමක් සිදු කළ දිනය කවරේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කළ සමාගම් හා එම සමාගම් අයත් රටවල් කවරේද;

(iii) ටෙන්ඩරය ලබාදුන් සමාගම කවරේද;

(iv) එම සමාගමට ටෙන්ඩරය ලබා දීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5950/’15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යවරයාගේ සහ එම රාජ්‍ය අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩල පත් කිරීම් ජනාධිපති ලේකම්ගේ අංක CA/1/171/1 හා 2010 මැයි 14 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය අනුව සිදුකර තිබේද;

(ii) ඉහත සඳහන් කාර්ය මණ්ඩලයන්ට පත්කර ඇති අයගේ නම්, තනතුරු, ලිපිනයන්, දුරකථන අංක, සුදුසුකම් ආදී විස්තර සභාගත කරන්නේද;

(iii) එම කාර්ය මණ්ඩලවල නිල වාහන හිමිකම් සහිත නිලධාරීන්ට ලබා දී ඇති වාහනවල වර්ග, අංක හා ඒවායේ නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

(iv) ඉහත අමාත්‍යවරයාට සහ රාජ්‍ය අමාත්‍යවරයාට ලබා දී ඇති වාහන කවරේද;

(v) එම වාහනවලට අමතරව අමාත්‍යාංශ සංචිතයෙන් හෝ විෂයානුබද්ධ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවලින් මෙන්ම විවිධ ව්‍යාපෘති වලින් අමාත්‍යවරයාට, රාජ්‍ය අමාත්‍යවරයාට හෝ එම කාර්ය මණ්ඩලවලට ලබා ගෙන ඇති වාහන කවරේද;

(vi) එම වාහනවල අංක, වර්ග හා නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 ජූලි මස 09 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

5464/’14

ගරු බුද්ධික පතිරණ මහතා,— මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දක්ෂිණ, කටුනායක - කොළඹ හා පිටත වටරවුම් යන අධිවේගී මාර්ග හේතුවෙන් කුඹුරු ඉඩම්, තෙත්බිම් හා ගංගා පිටාර තැනි ආදියට හානි සිදු වී ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් අධිවේගී මාර්ග අවට ජනයා ගංවතුර තර්ජනයකට මුහුණ දී සිටින බවත්;

(iii) මෙම පරිසර හානිය සමස්ත රටේම පරිසර තුලිතතාවට බලපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අධිවේගී මාර්ග හේතුවෙන් ගංවතුර තර්ජනයට ලක් වී තිබෙන ප්‍රදේශ එම තර්ජනයෙන් මුදා ගැනීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

(iii) හානියට ලක් වූ පරිසර පද්ධතීන් සංරක්ෂණයට එතුමා පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අ(ii) හි සඳහන් ගංවතුර තර්ජනය හා සම්බන්ධ වන අනෙකුත් අමාත්‍යාංශ සමඟ ඒකාබද්ධ වැඩ සටහනක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩ සටහන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5951/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැවිලි කර්මාන්ත අමාත්‍යවරයාගේ, රාජ්‍ය අමාත්‍යවරයාගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩල පත් කිරීම් ජනාධිපති ලේකම්ගේ අංක CA/1/171/1 හා 2010 මැයි 14 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයට අනුව සිදුකර තිබේද;

(ii) ඉහත සඳහන් කාර්ය මණ්ඩලයන්ට පත්කර ඇති අයගේ නම්, තනතුරු, ලිපිනයන්, දුරකථන අංක, සුදුසුකම් ආදී විස්තර සභාගත කරන්නේද;

(iii) එම කාර්ය මණ්ඩලවල නිල වාහන හිමිකම් සහිත නිලධාරීන්ට ලබා දී ඇති වාහනවල වර්ග, අංක හා ඒවායේ නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

(iv) ඉහත අමාත්‍යවරයාට, රාජ්‍ය අමාත්‍යවරයාට සහ නියෝජ්‍ය අමාත්‍යවරයාට ලබා දී ඇති වාහන කවරේද;

(v) එම වාහනවලට අමතරව, අමාත්‍යාංශ සංචිතයෙන් හෝ විෂයානුබද්ධ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවලින් මෙන්ම විවිධ ව්‍යාපෘති වලින් අමාත්‍යවරයාට, රාජ්‍ය අමාත්‍යවරයාට, නියෝජ්‍ය අමාත්‍යවරයාට හෝ එම කාර්ය මණ්ඩලවලට ලබා ගෙන ඇති වාහන කවරේද;

(vi) එම වාහනවල අංක, වර්ග හා නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6111/'15

ගරු ඊ. සරවනපවන් මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වන්නි යුද්ධයේදී අවතැන්වූවන් සඳහා පිහිටුවන ලද සියලු සුබසාධන මධ්‍යස්ථානවල දී පොලිස් දෙපාර්තමේන්තුව විසින් යුද්ධයේදී සිදුවූ ජීවිත හා දේපළ හානි පිළිබඳව පැමිණිලි සටහන් කර ගැනීමක් සහ ඊට අදාළව ඇස්තමේන්තුගත කිරීමක් සිදු කළ බව එතුමා දන්නෙහිද?

(ආ) යුද වන්දි ලබාගැනීමේ කටයුතු පහසු කිරීම සඳහා ඉහත සඳහන් පරිදි සටහන් කරගත් පැමිණිලිවල පිටපතක් මහජනතාවට ලබා දිය හැකිද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5548/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— සමාජසේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව පුරා ගව කුර හා මුඛ රෝගය ඉතා සීඝ්‍රයෙන් පැතිරෙමින් පවතින බවත්;

(ii) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සතුව මෙම රෝගය වැළැක්වීමට දිය යුතු එන්නත් ප්‍රමාණවත්ව නොමැති බවත්;

(iii) එම රෝගය පාලනය කිරීම සම්බන්ධයෙන් උක්ත දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ චක්‍රලේඛයේ බොහෝ කරුණු අවලංගු කර තිබෙන බවත්;

(iv) එසේ කිරීම හේතුවෙන් එම රෝගය පාලනය කිරීමට නොහැකි වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ චක්‍රලේඛයෙන් ඉවත් කළ කරුණු කවරේද;

(ii) එම කරුණු ඉවත් කිරීමට හේතු කවරේද;

(iii) නැවත එම කරුණු ඇතුළත් කිරීමට කටයුතු කරන්නේද;

(iv) ගව කුර හා මුඛ රෝගය පාලනය කිරීමට අවශ්‍ය ඖෂධ හිඟයකින් තොරව ලබාදීමට ගනු ලබන පියවර කවරේද;

(v) එම රෝගය නිසා විනාශ වන ගව සම්පත බෝ කිරීමට ගන්නා කඩිනම් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5952/’15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුදල් අමාත්‍යවරයාගේ හා රාජ්‍ය අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩල පත් කිරීම් ජනාධිපති ලේකම්ගේ අංක CA/1/171/1 හා 2010 මැයි 14 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය අනුව සිදුකර තිබේද;

(ii) ඉහත සඳහන් කාර්ය මණ්ඩලයන්ට පත්කර ඇති අයගේ නම්, තනතුරු, ලිපිනයන්, දුරකථන අංක, සුදුසුකම් ආදී විස්තර සභාගත කරන්නේද;

(iii) එම කාර්ය මණ්ඩලවල නිල වාහන හිමිකම් සහිත නිලධාරීන්ට ලබා දී ඇති වාහනවල වර්ග, අංක හා ඒවායේ නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

(iv) ඉහත අමාත්‍යවරයාට හා රාජ්‍ය අමාත්‍යවරයාට ලබා දී ඇති වාහන කවරේද;

(v) එම වාහනවලට අමතරව අමාත්‍යාංශ සංචිතයෙන් හෝ විෂයානුබද්ධ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවලින් මෙන්ම විවිධ ව්‍යාපෘති වලින් අමාත්‍යවරයාට, රාජ්‍ය අමාත්‍යවරයාට හෝ එම කාර්ය මණ්ඩලවලට ලබා ගෙන ඇති වාහන කවරේද;

(vi) එම වාහනවල අංක, වර්ග හා නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6112/’15

ගරු ඊ. සරවනපවන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන්නි යුද්ධයේදී ෂෙල් හා උණ්ඩ ප්‍රහාරයන්ට ලක්වීම නිසා සිරුරට ඇතුල් වූ ෂෙල් හා උණ්ඩ කැබලි සහිතව ජීවත්වන සිවිල් වැසියන් සංඛ්‍යාව දිස්ත්‍රික් අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන් අතර සිටින පාසල් සහ විශ්වවිද්‍යාල සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් සේ සලකා එම සිසුන්ට විශේෂ සැලකීමක් ලබා දෙන්නේද;

(iv) එම අයගේ සුබසාධනය සඳහා දිගු කාලීන වශයෙන් ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

5549/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) විළවුන් උපකරණ හා ඖෂධ නියාමන අධිකාරිය තුළ පාලනය කළ නොහැකි තරමට දූෂණය ඔඩුදුවා ඇති බැවින් එහි සියලු ඉහළ සහ පහළ තනතුරු දරන සේවකයින්ට ස්ථාන මාරු ලබා දීම සිදු කළ යුතු බවට එම අධිකාරියේ අධ්‍යක්ෂ අමල් හර්ෂ සිල්වා මහතා විසින් අමාත්‍යාංශය වෙත දැනුම් දී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත නම් සඳහන් අධ්‍යක්ෂවරයාගේ ඉල්ලීම් සම්බන්ධයෙන් පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ස්ථාන මාරු ලබා දුන් නිලධාරීන්ගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම නිලධාරීන්ට ස්ථාන මාරු ලබා දුන් ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) විළවුන් උපකරණ හා ඖෂධ නියාමන අධිකාරියේ සිදු වී ඇති දූෂණ ක්‍රියා සම්බන්ධව පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම පරීක්ෂණයේ ප්‍රතිඵල ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5953/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යවරයාගේ සහ එම නියෝජ්‍ය අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩල පත් කිරීම් ජනාධිපති ලේකම්ගේ අංක CA/1/171/1 හා 2010 මැයි 14 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයට අනුව සිදුකර තිබේද;

(ii) ඉහත සඳහන් කාර්ය මණ්ඩලයන්ට පත්කර ඇති අයගේ නම්, තනතුරු, ලිපිනයන්, දුරකථන අංක, සුදුසුකම් ආදී විස්තර සභාගත කරන්නේද;

(iii) එම කාර්ය මණ්ඩලවල නිල වාහන හිමිකම් සහිත නිලධාරීන්ට ලබා දී ඇති වාහනවල වර්ග, අංක හා ඒවායේ නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

(iv) ඉහත අමාත්‍යවරයාට සහ නියෝජ්‍ය අමාත්‍යවරයාට ලබා දී ඇති වාහන කවරේද;

(v) එම වාහනවලට අමතරව අමාත්‍යාංශ සංචිතයෙන් හෝ විෂයානුබද්ධ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවලින් මෙන්ම විවිධ ව්‍යාපෘති වලින් අමාත්‍යවරයාට, නියෝජ්‍ය අමාත්‍යවරයාට හෝ එම කාර්ය මණ්ඩලවලට ලබා ගෙන ඇති වාහන කවරේද;

(vi) එම වාහනවල අංක, වර්ග හා නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2015 ජූලි මස 10 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4822/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ, මාලිගාවත්ත නිවාස යෝජනා ක්‍රමයේ පිහිටා ඇති කඩ කාමර හා රථ ගාල ගැණුම්කරුවන්ට ලබාදීමේදී ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේද;

(ii) ටෙන්ඩර් කැඳවීමක් සිදු නොකළේ නම්, ඒවා ලබාදුන් ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත පරිදි ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේ නම්, ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ අයගේ නම්, ලිපිනයන් සහ එක් එක් ටෙන්ඩර් අයදුම්පතෙහි සඳහන් මුදල වෙන් වෙන් වශයෙන් ඇතුළත් ලේඛනයක් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) මාලිගාවත්ත නිවාස යෝජනා ක්‍රමයේ පිහිටි කඩ කාමර සහ රථ ගාලෙහි වර්තමාන හිමිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එම එක් එක් පුද්ගලයා විසින් එම කඩ කාමර සහ රථ ගාල ලබාගෙන ඇති මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සභාගත කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5954/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයාගේ සහ එම රාජ්‍ය අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩල පත් කිරීම් ජනාධිපති ලේකම්ගේ අංක CA/1/171/1 හා 2010 මැයි 14 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය අනුව සිදුකර තිබේද;

(ii) ඉහත සඳහන් කාර්ය මණ්ඩලයන්ට පත්කර ඇති අයගේ නම්, තනතුරු, ලිපිනයන්, දුරකථන අංක, සුදුසුකම් ආදී විස්තර සභාගත කරන්නේද;

(iii) එම කාර්ය මණ්ඩලවල නිල වාහන හිමිකම් සහිත නිලධාරීන්ට ලබා දී ඇති වාහනවල වර්ග, අංක හා ඒවායේ නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

(iv) ඉහත අමාත්‍යවරයාට සහ රාජ්‍ය අමාත්‍යවරයාට ලබා දී ඇති වාහන කවරේද;

(v) එම වාහනවලට අමතරව අමාත්‍යාංශ සංචිතයෙන් හෝ විෂයානුබද්ධ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවලින් මෙන්ම විවිධ ව්‍යාපෘති වලින් අමාත්‍යවරයාට, රාජ්‍ය අමාත්‍යවරයාට හෝ එම කාර්ය මණ්ඩලවලට ලබා ගෙන ඇති වාහන කවරේද;

(vi) එම වාහනවල අංක, වර්ග හා නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5775/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂය තුළ දී සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වැය කළ මුදල කොපමණද;

(ii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කළ සමාගම කවරේද;

(iii) එම සමාගම වෙත අදාළ ප්‍රතිසංස්කරණ කටයුතු ලබාදීමේදී ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේද;

(iv) එසේ නම්, එම සමාගම ඉදිරිපත් කළ ටෙන්ඩරයේ වටිනාකම කොපමණද;

(v) ටෙන්ඩර් ඉදිරිපත් කළ අනෙකුත් සමාගම් කවරේද;

(vi) එම සමාගම්වල නම්, ලිපිනයන්, දුරකථන අංක, අයත් රටවල් හා ටෙන්ඩර් වටිනාකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත සමාගම සඳහා ටෙන්ඩරය ලබා දීමට හේතු කවරේද;

(ii) එම සමාගම සමග කටයුතු කිරීමෙන් රජයට අලාභයක් සිදුවී ඇති බව දන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5955/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයාගේ සහ එම රාජ්‍ය අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩල පත් කිරීම් ජනාධිපති ලේකම්ගේ අංක CA/1/171/1 හා 2010 මැයි 14 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය අනුව සිදුකර තිබේද;

(ii) ඉහත සඳහන් කාර්ය මණ්ඩලයන්ට පත්කර ඇති අයගේ නම්, තනතුරු, ලිපිනයන්, දුරකථන අංක, සුදුසුකම් ආදී විස්තර සභාගත කරන්නේද;

(iii) එම කාර්ය මණ්ඩලවල නිල වාහන හිමිකම් සහිත නිලධාරීන්ට ලබා දී ඇති වාහනවල වර්ග, අංක හා ඒවායේ නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

(iv) ඉහත අමාත්‍යවරයාට හා රාජ්‍ය අමාත්‍යවරයාට ලබා දී ඇති වාහන කවරේද;

(v) එම වාහනවලට අමතරව අමාත්‍යාංශ සංචිතයෙන් හෝ විෂයානුබද්ධ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවලින් මෙන්ම විවිධ ව්‍යාපෘති වලින් අමාත්‍යවරයාට, රාජ්‍ය අමාත්‍යවරයාට හෝ එම කාර්ය මණ්ඩලවලට ලබා ගෙන ඇති වාහන කවරේද;

(vi) එම වාහනවල අංක, වර්ග හා නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5776/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සතු ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් පිහිටා ඇති ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගුවන් විදුලි සංස්ථාව සතු ඉඩම් විකිණීමට තීරණයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, ඊට හේතුව කවරේද;

(iii) එම ඉඩම් විකිණීමට සැලසුම්කර ඇති ආකාරය කවරේද;

(iv) එකී ඉඩම් විකිණීම නවතාලීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5956/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකර්ම අමාත්‍යවරයාගේ සහ එම නියෝජ්‍ය අමාත්‍යවරියගේ කාර්ය මණ්ඩල පත් කිරීම් ජනාධිපති ලේකම්ගේ අංක CA/1/171/1 හා 2010 මැයි 14 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයට අනුව සිදුකර තිබේද;

(ii) ඉහත සඳහන් කාර්ය මණ්ඩලයන්ට පත්කර ඇති අයගේ නම්, තනතුරු, ලිපිනයන්, දුරකථන අංක, සුදුසුකම් ආදී විස්තර සභාගත කරන්නේද;

(iii) එම කාර්ය මණ්ඩලවල නිල වාහන හිමිකම් සහිත නිලධාරීන්ට ලබා දී ඇති වාහනවල වර්ග, අංක හා ඒවායේ නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

(iv) ඉහත අමාත්‍යවරයාට හා නියෝජ්‍ය අමාත්‍යවරියට ලබා දී ඇති වාහන කවරේද;

(v) එම වාහනවලට අමතරව අමාත්‍යාංශ සංචිතයෙන් හෝ විෂයානුබද්ධ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවලින් මෙන්ම, විවිධ ව්‍යාපෘති වලින් අමාත්‍යවරයාට, නියෝජ්‍ය අමාත්‍යවරියට හෝ එම කාර්ය මණ්ඩලවලට ලබා ගෙන ඇති වාහන කවරේද;

(vi) එම වාහනවල අංක, වර්ග හා නිෂ්පාදිත වර්ෂයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?